# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

No 160G, Poorwarama Road, Kirulapone **Tel:** +094-11 2826388/+094-11 2826384

**Fax**: +094-11 2826146 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org


මහින්ද දේශප්‍රිය මහතා, සභාපති, ජනාධිපති නීතීඥ නලීන් අබේසේකර මහතා, සාමාජික, මහාචාර්ය රත්නජීවන් හූල් මහතා, සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ පාර,
රාජගිරිය,

2019 - 10- 13

**<u>ජනාධිපතිවරණය 2019 - ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත්ව ඇති අපේක්ෂකයන්, තම මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය සඳහා දැනට සක්‍රිය සේවයේ නිරත දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධරයන්, පූර්වයේ කර ඇති ප්‍රකාශ යොදා ගැනීම</u>**

ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත්වන කවර අපේක්ෂකයෙක් වුවද තම මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය මෙහෙයවිය යුත්තේ ඔබ කොමිෂන් සභාව මගින් ප්‍රකාශිත අපේක්ෂකයන් සඳහා වූ ආචාර ධර්ම පද්ධතියට අනුගත වෙමින් වුවද, එලෙස ප්‍රකාශිත උල්ලංඝනය කරමින් පල කොට ඇති පුවත්පත් දැන්වීමක් පිළිබඳව ඔබ කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

පෙරදිනයේ එනම් වසර 2019 ඔක්තෝබර් මස 12 වැනි දින පුවත්පත් තුනක පමණ පිටුවක් පුරා පළකොට ඇති දැන්වීමක් සඳහා හිටපු ආරක්ෂක හමුදා ප්‍රධානීන් විවිධ අවස්ථාවන්හිදී ජනාධිපතිවරණ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා පිලිබඳ සිදුකොට ඇති ප්‍රකාශ උපුටා දක්වා ඇත. එහිලා වර්තමාන යුධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා වසර 2009 දෙසැම්බර් මස 28 වැනි දින සිදුකොට ඇති ප්‍රකාශයක් උපුටා දක්වා ඇත. එහිලා පැණ නගින ගැටලුව වන්නේ දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ මාණ්ඩලික නිලධරයෙකුගේ ප්‍රකාශයක් තම මැතිවරණ ප්‍රචාරය සඳහා යොදා ගැනීම පමණක් නොවේ. ඒ සඳහා උපයෝගී කරගත් ප්‍රකාශය කරන ලද තැනැත්තා අදවන විට සක්‍රීය සේවයේ සිටින යුධ හමුදාපතිවරයා වීමයි.

මෙය ප්‍රවණතාවක් ලෙස අනෙකුත් අපේක්ෂකයන්ද අනුගමනය කළහොත් එය සුපිළිපන්න මැතිවරණයක් සාක්ෂාත් කිරීම සඳහා වන ඔබ කොමිෂන් සභාවේ ප්‍රයත්නය අභියෝගයට ලක්වන්නක් වන අතර යුධ හමුදාව වැනි ආයතනයන්හි ප්‍රධානීන්ගේ අතීත ප්‍රකාශ මෙලෙස උපුටා දැක්වීම මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක අවශ්‍යයෙන්ම පැවතිය යුතු ජීව ගුණය දැඩි බලපෑමකට ලක්කරනු ලබන්නේය යන්න අපගේ විශ්වාසයයි.

මෙකී කරුණ ප්‍රමුඛ කරුණක් සේ සලකා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් ඊට අදාළව ගනුලබන යම් පියවරක් වේනම් අප දැනුම්වත් කරන ලෙස ද ඉතා කාරුණිකව ඉල්ලා සිටීමට කැමැත්තෙමු.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සුරක්ෂිත කිරීම සඳහා ඔබ කොමිෂන් සභාව දැනටමත් ගනිමින් සිටින විවිධ ක්‍රියාමාර්ග පිලිබඳ අප මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානයේ සතුට පළකරනු ලබන අතර මෙකී කරුණ පිළිබඳව ඔබ කොමිෂන් සභාව සුදුසු ක්‍රියාමාර්ගයක් ගනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු.

ස්තූතියි,

මංජුල ගජනායක
ජාතික සම්බන්ධීකාරක